සංක්‍රමණිකයකුගේ සටහන

සුපර් ස්ටාර්

සුපර් ස්ටාර් තරුණයන් ගැන අපට කතා කරන්න දෙයක් ඉතිරි වෙලා නැති තරම්. ඒත් මේ සටහන ලියන්නේ වෙනත් හේතුවක් නිසයි. මොවුන්ගේ මේ ජනප්‍රියතාවය රට පුරා උන්මාදයක් වසංගතයක් මෙන් පැතිරෙන්නට පටන් ගත් මොහොතක එය වලක්වන්න තීරනාත්මක මෙහෙවරක් සිදු වුනේ සැබෑ ලෙසම අස්ගිරියේ දැදැගම ධම්මානන්ද හාමුදුරුවන්ගේ ලිපි දෙක තුනින් බව ඕනෑම කෙනෙක් පිළිගන්නවා. මෙ තරුණයන් ගේ දක්ෂකම් වලට නිගුහයක් නොකොට, ද්වේශයකින් නොරව, මැදිහත් සිතින් අපේ තරුන පරම්පරාවට අනතුරු ඇගවීමකින් දැනුවත් කළේ උන්වහන්සේ යි. මේ සන්දර්ශනත් සමග සමාජය වෙනස් වෙන්නේ කෙසේදැයි අපි දැන ගත්තේ මේ ලිපි නිසායි. උන්වහන්සේට අපේ ගෞරවය.

අනෙක දැං මේ තරුණයන්ට සිදුවන්නේ කුමක්ද? ඉදිරියටත් අනුන්ගේ ගීත වලින් ඔවුනට යැපෙන්නට හැකි වන්නේ නැහැ. දැං කාලය පැමින ඇත්තේ ස්වොත්සාහයෙන් නැගිටීමකටයි. මහාරාජලාට තව දුරටත් ඔවුන් අලෙවි කල හැකි භාන්ඩ නොවේ. වෙලෙඳුන්ට වටින්නේ ඉල්ලුමක් ඇති භාන්ඩයි. සිරස මාස ගනනාවක් ඔවුන් පෙන්වා මුදල් උපයා ගත්තේ අවංක චේතනාවෙන් නම් ඔවුනට අත දිය යුත්තේ දැනුයි. ඒ බවක් පෙනෙන්නට නැහැ. ඔවුන්ගේ තිකුත් වූ පලමු ගීයෙන්ම එය ඔප්පු උනා. දැන් සිරසට අවශ්‍ය අලෙවි කල හැකි අලුත් මුහුනුයි. ඒකට ඔවුන් වෙලඳපල අගේට සකස් කර ගත්තා.

වෙනස

තස්මේනියාවේ පතල් කම්කරුවන්ගේ කතාව දැන් අපි හැමෝම දන්නවනේ. අද ඔවුන්ගේ තත්වය කොහොමද? තව දුරටත් ඔවුනට පතල් රැකියාව අවශ්‍ය වෙන එකක් නැහැ. ඔවුනට ලැබුනු වරප්‍රසාද ගැන අපට ප්‍රශ්නයක් නැහැ. ඒත් අපේ රටේ බෝගල පතලේ කම්කරුවෙකුට ඔය දේම උනා නම් තත්වය කොහොමද? අඩුම තරමේ වන්දි මුදලක් ලබා ගන්න වත් කී පාරක් නම් කන්තොරු ගානේ රස්තියාදු වෙන්න වෙයිද? එහෙම පතලක් තියෙනවා කියල දන්නෙත් කීයෙන් කී දොනද?
ආපහු කෙසෙල් කන්න අපට ලබන නොවැම්බර් වෙනකන් ඉන්න වෙයි වගේ.

ක්වීන්ස්ලන්තයේ කෙසෙල් වගාවේ ලබන කන්නයේ කැන් කපන කල්. කෙසෙල් දැන් ටූරැක් කට්ටියගේ කෑමක් ගානට ඉහළ ගිහින්. ඉන්දුනීසියාවෙන් හරි වියට්නාමෙන් හරි කෙසෙල් ආනයනය කරලා ඉතා අඩු මිලට දෙන්න හැකියාව තිබිය දී ත් එහෙම කරන්නේ නැහැ. මිනිස්සුත් ඔය අපූරුවට කෙසෙල් නොකා ඉන්නෙ. අපේ රටේ වගාවකට එහෙම උනා නම් පහුවෙනදම ඉන්දියාවෙන් හරි ගෙනැල්ල දෙන්නැද්ද? (ලූනු, අල, මිරිස් වලට කරනව වගේ) අපේ ගොවිය වහ බිවත්. නැත්නම් මිනිස්සු ආන්ඩුව කන්න හදනවනෙ. අපි එහෙමයි.

ශූරින්

මෙල්බර්න් සිංහල ගුවන්විදුලි සේවාවන් අතරින් ජනප්‍රිය වැඩ සටහන තේරුවොත් වොයිස් ඔෆ් ලංකා වැඩ සටහන ඉතා ඉහල තැනක් ලැබෙන බවට විචාදයක් නැහැ. ඉරිදා රෑට සවන් දෙන රසික ප්‍රමානයෙන් ඒක තේරුම් ගන්න පුලුවන්. විනෝදය, සතුට, හාස්‍යය, උපහාසය, දැනුම මෙන්ම වෝi උපදෙස්ද ලබා දෙන මේ වැඩ සටහන මෙහෙයවන රංජිත් හා රුඹිට අපේ ගෞරවය හිමිවිය යුතුයි. එසේම අප දකින අඩුපාඩුවක් විවේචනයක් කල විට ඔවුන් විවෘත මනසින් යුතුව එය බාර ගනිව් කියලත් හිතනවා. රංජිත්, රුඹි, ඔබ දෙපල හිතරම යොදන ශූරින් යන වචනය ගැනයි මේ ගැටලුව. අප පැහැදිලිවම දන්නවා ඔබ කලාකරුවන්ට ඇති ගෞරවය නිසාම මෙය යොදන බව. ඒත් මේ යෙදීමේ දී ඒ ඒ පුද්ගලයාට ඒ යෙදීම කොතරම් උචිත දැයි මඳක් සිතා බලනවා නම් වටිනවා.

ගීතය, නාට්‍යය, නවකතාව, සිනමාව ආදී ඕනෑම ක්ෂෙත්‍රයකදී පුද්ගල නාමය අගට ශූරින් යන්න යොදනුයේ බොහෝ විට අදාල පුද්ගලයාට අදාල ක්ෂෙත්‍රයෙහි ඇති නිපුනතාව, ඇසූ පිරූ තැන් ඇති බව, සමාජයට සිදුවී ඇති මෙහෙවර ආදී බොහෝ කරුනු සලකා බලලායි. හුදෙක් ශිල්පියාගේ ජනප්‍රියතාවයම සලකා නොවෙයි.

උදාහරනයකට සාහිත්‍යයේ දී මාර්ටින් වික්‍රමසිංහ, ඩබ් ඒ සිල්වා වැනි නම් අගට ශූරින් යෙදෙනවා මිසක ඩීමන් ආනන්ද, සුජීව ප්‍රසන්න ආරච්චි වැනි නම් අගට ශූරින් යන පදය යොදන්නෙ නැහැ නේද? ඒසේම ගීතයේ දී අමරදේවයන්ට ශූරින් යොදන ලෙසම ජෝතිපාලට හෝ මිල්ටන්ට එසේ යෙදීම කොයි තරම් උචිත ද? මා කිසි විටකවත් ඩීමන් ආනන්දට සුජීව ප්‍රසන්නආරච්චිට ජෝතිපාලට හෝ මිල්ටන්ට නිගරු කරනවා හෝ අඩු තක්සේරු කරනවා නෙවෙයි. ඔවුන් මගේ ප්‍රියතම කලාකරුවන්. එහෙත් ඔවුන් හැඳින්වෙන විට අසහාය, අමරනීය, ජනහද බැඳගත් වැනි යෙදුම් වඩාත් ගැලපෙන බව මගේ හැඟීමයි. අමරදේව ශූරින් හා ප්‍රේමනීය ගායක අමරදේව අතරත් මිල්ටන් ශූරින් හා ප්‍රේමනීය ගාය මිල්ටන් අතර වෙනස ඔබ තේරුම් ගනිව් යැයි සිතනවා.
වොයිස් ඔෆ් ලංකා ගුවන් විදුලිය සාර්ථක වීමට ආසිරි.

වන් ෂොට් බැලුවා

කලාව කා සඳහාද යන්න ගැන වාදයන් බොහෝ කල් සිට පැවත එන්නක්. කලාව කලාව සඳහාම විය යුතු බව කොටසක් කියනවා. කලාව ජනතාව සඳහා විය යුතු බව අනෙක් කොටසගේ මතයයි. කලාව ජනතාව සඳහා ය යන්නට අපිත් කැමතියි. ඒත් ජනතාවට දිය යුත්තේ කුමන කලාවද යන්න නම් දැන් ගැටලුවක්. සිනමාව කලාවේ ප්‍රබල අංගයක්. මේ සිනමා කලාව විවිධ වකවානු වල නැගීමත් බැසීමත් සිදුවුන බව අප කවුරුත් දන්නවා. මේ නගින බහින කලාව තුල වන් ෂොට් ගැන අපි කතා කරන්නේ කුමන තැනක සිට ද? බොහෝ දෙනා මේ ගැන කල විචාර අප දුටුවේ මාධ්‍ය තුලින් පමනයි. පසුගිය දිනෙක අප සැබෑවින් ම දුටුවා. ආන්.. විහ්මයජනකයි. ලංකාවේ මෙතෙක් වැඩිම ආදායම් වාර්තාව එය සතුයි. රන්ජන් ගැනවත් ඔහුගේ සිනමාව භාවිතාව ගැනවත් අපට ගැටලුවක් නැහැ. ඒත් අපේ රටේ සිනමා රසිකයන් ඉන්නේ කවර තැනකද? ප්‍රශ්නය ඒකයි. ඉස්සර නම්

31 පිටට

දේදුන්න

විද්‍යා පොත පත කියවන්නත් සිංහලෙන් විද්‍යා ලිපි ලියන්නත් අපේ ආසාව වැඩිවෙන්න බල පෑ එක් හේතුවක් වූයේ රුසියානු ලේඛක වයි පෙරල්මන් ගේ සිංහලට පෙරළුණ විද්‍යා පොත් කියවන්නට ලැබීම බව මට මතකය. ඔහුගෙ පොත් හුදෙක් නීරස විද්‍යාත්මක කරුනු වලින් පිරුණ ඒවා නොවී ය. එදිනෙදා ජීවිතයේ දී අපි අත් දකින සංසිද්ධීන් තුළ සැඟව ගත් විද්‍යාත්මක මූලධර්ම රසවත්ව පැහැදිලි කිරීමට ඔහු හපනෙක් විය. පෙරල්මන් ඒ අතරේ අපූරු දෙයක් කළේ ය. ඒ යුගයේ පළවී තිබූ නොයෙකුත් සාහිත්‍ය කෘති වල විද්‍යාත්මකව වැරැදි තැන් ඔහු සිය පොත් මගින් පෙන්වා දුන්නේ ය.
ඒ බොහෝ කරුණු දැන් මගේ මතකයෙන් බැහැරව යමින් තිබෙයි. කිපයක් පමණක් මතක ය. අදිසි මිනිසා (The Invisible Man -H. G. Wells) කතාවේ කියැවුණේ එක්තරා බෙහෙතක් බීවි තරුණයෙක් අදිසි මිනිසකු වූ හැටි ය. වයි පෙරල්මන් සිය පොතක කීවේ ආලෝකය පිළිබඳ භෞතික විද්‍යාත්මක මූලධර්ම අනුව කිසිදාක එවැනි අදිසි මිනිසකු බිහි කරන්නට නොහැකි බව ය.

යම් වස්තුවක් අපට පෙනෙන්නේ ඒ මත වැටෙන ආලෝක කිරණ වලින් යම් ප්‍රමාණයක් පරාවර්තය වී නැවත අප කරා එන නිසා ය. යමක් අදිසි වීමට නම් ඒ මත වැටෙන සියලුම ආලෝක කිරණ කිසිම බාධාවකින් තොරව ඒ තුලින් ගමන් කළ යුතු ය.

අපට යමක් පෙනෙන්නේ යම් වස්තුවකින් එන ආලෝක කිරණ අපේ ඇසේ දෘෂ්ටි විතානය මත පතිත වීම නිසා ය. අදිසි මිනිසකු සිටියි නම් ඔහුගේ දෘෂ්ටි විතානය මත ආලෝකය පතිත නොවෙයි. ඒ සියලුම කිරණ ඇස හරහා ගමන් කරන බැවින් ඔහු නියත වශයෙන්ම අන්ධයෙකු වන බව පෙරල්මන් අපූරුවට පැහැදිලි කළේ ය.

පෙරල්මන්ගේ මේ අපූරු පොත පත කියවීම නිසා ඇති වූ නරක පුරුද්දක් තවමත් මා තුළ ඇත. පොතක යම් සිදුවීමක් කියවන විට විද්‍යාත්මකව මෙය සිදුවිය හැක්කක් ද යි සොයා බැලීම ඒ නරක පුරුද්දයි. සාහිත්‍ය රස වින්දනයට එය බාධාවක් බව මම දනිමි.

පසුගිය දාක මම කුමාර කරුණාරත්න ශූරින්ගේ නවකතාවක් කියවන්නට පටන් ගත්තෙමි. කතාව ඇරඹෙන්නේ මුහුදු වෙරළකිනි. කතානායිකාව ඈත ක්ෂිතිජය දෙස බලා සිටියි. ක්ෂිතිජය දෙසින් හිරු බැස යමින් තිබෙයි. සිහින් සිරිපොද වැස්සක් වැටෙයි. ක්ෂිතිජයට ඉහළ අහසේ පායා ඇති දේදුන්නකි.

ඔබේ සිතේ අපූරු චිත්ත රූපයක් මැවෙනු ඇත. කොයි තරම් සුන්දර සන්ධ්‍යාවක් ද? එනමුදු සමාවන්න. ඔබේ අපූරු චිත්ත රූපය බිඳ දමන්නට මට සිදුවෙයි. මේ ආකාරයට දේදුන්නක් පෑයීම කිසි දිනෙක සිදුවිය හැකි දෙයක් නොවේ. සිරි පොද වැස්සත් බැස යන ඉරත් දේදුන්නක් ඇති කරන්නට සමත් වන නමුත් එය මේ ආකාරයට කිසිදා පායන්නේ නැත. සැම විටම දේදුන්න පිහිටන්නේ ඔබ සූර්යයා දෙසට හැරී සිටින විට ඔබට පිටුපසිනි. වෙනත් වචන වලින් කියන්නේ නම් ඔබ සූර්යයාට පිටුපා සිටින විට ඔබට ඉදිරියෙනි. සූර්යයාත් දේදුන්නත් ඔබට ඉදිරියෙන් කිසිදා පිහිටන්නේ නැත.



දේදුන්නක් ඇතිවන්නේ හිරු රැස් දිය බිඳු තුළට වැදී පූර්ණ පරාවර්තනයක් සිදුවීමෙනි. මෙයට අපි පූර්ණ අභ්‍යන්තර පරාවර්තනය යයි කියමු. මේ පූර්ණ අභ්‍යන්තර පරාවර්තනයේදී සුදු පැහැ හිරු රැස් දම්, ඉන්ඩිගෝ, කොළ, කහ, තැඹිළි, රතු යන වර්ණ වලට වෙන්වෙයි. මේ පරාවර්තිත කිරණ අප වෙත එන කෝණය අනුව අපට පෙනෙන්නේ ඒවා අහසේ එක්තරා පටි තීරුවක සිට එන්නාක් මෙනි. අප දේදුන්න ලෙස දකින්නේ මේ පටි තීරුවයි.
දේදුන්නේ වර්ණ හත මතක තබා ගන්නේ කෙසේ දැයි යන පැනය එක් කලෙක මගේ සිතට වද දුන්නක් විය. ප්‍රශ්නය විසඳුවේ දැන් නවසිලන්තයේ වාසය කරන මගේ කළ්‍යාණ මිත්‍ර උදය ලක්ෂ්මන් ය. විසඳුම ඉතා පහසු ය.

"දඉනිකොකතැර" කියන වචනය පාඩම් කරගන්න.." ඔහු මට කීවේ ය. ඒ අකුරු වලින් කියැවෙන්නේ දම් ඉන්ඩිගෝ නිල් කහ කොල තැඹිලි රතු යන වර්ණ හතයි දේදුන්නේ පාට හත ඉංග්‍රීසියෙන් මතක තබා ගන්නට නම් "VIBGYOR" යන වචනය මතක තබා ගන්න ඒ Violet, Indigo, Blue, Yellow, Orange, Red යන වචන වල මුල් අකුරු වල එකතුවයි.

කෘතිම ලෙස දේදුන්නක් තනාගන්නට රිසි නම් එයට ද උදව් කරන්නට මට පුළුවන. හිරු එළිය හොඩින් ඇති වෙලාවක ඉරට පිටුපා සිට ගන්න. සියුම් දිය බිඳිති සෑදෙන සේ වතුර බටයකින් අහසට වතුර විදින්න. එසේත් නැත්නම් මුව පුරා වතුර පුරවා ගෙන "පූහ් " ගා ඉහළට විදින්න. කුඩා ප්‍රමාණයේ දේදුන්නක් දැක ගන්නට ඔබට හැකි වනු ඇත. ජලය නාස්ති කිරීම වෙනුවෙන් විත්තෝ රියා අණ්ඩුවෙන් දඩුවමක් ලැබුණහොත් මා ඒ නඩුවේ වග උත්තර කරුවකු නොකරන්නැයිද ඉල්ලා සිටිමි.

ජගත් ජේ එදිරිසිංහ

හැන්දෑවට පායන හිරු සහ ඩීබී

ඩී බී කුරුප්පු මහත්තයගෙ ජීවන කතාවේ පළමු පියවර (ඔහු එහි දෙවන පියවරක් ලියන බව මට ඉර හඳ සේ විශ්වාස බැවින් එසේ හඳුන්වමි) හැන්දෑවට පායන හිරු පොත පිළිබඳ සටහනක් ලියනනට මම පසුගිය මාස දෙකෙහිම සිතා සිටියෙමි. පොත ගැන ලියන්නට මට ශක්තියක් නැත. ඩීබී ගේ වියත්, උපහාස රසය අඩු නැති බස් වහරින් පෝෂිත මේ කෘතිය හුදු ආත්ම චරිත කතාවකින් ඔබ්බට ගිය, රටේ මෑත ඉතිහාසයේ, දේශපාලනයේ, සමාජයේ හරස්කඩක් පිළිබිඹු වන කෘතියක් ලෙස හඳුන්වන්නට මම කැමැත්තෙමි.

කළකට පසු මුල සිට අගට අකුරක් නෑර කියැවූ හැන්දෑවට පායන හිරු මගේ සිත බෙහෙවින් කම්පනයට පත් කළ කෘතියක් විය. ඒ සසළ වීම සිතේ ඇති වූයේ මේ සා වටිනා ලේඛකයකු අප අතර සිටින බවවත් නොදැන්නා සමාජයක හුදකලාව සිටිමින් මේ වියත් මිනිසා සිංහල සාහිත්‍යය උදෙසා කරන සේවය නිසි අගය කිරීමකට ලක්වූයේ ද යන කාරණය සිතට කා වැදීම නිසා ය.

ලංකාවේ සිට පැමිණි මංජුල වෙඩිවර්ධන ලේඛකයා මා හමුවූ පළමු මොහොතේම මගෙන් ඉල්ලා සිටියේ "ඔස්ට්‍රේලියාවේ ඉඳන් පොත් ලියන ඩී බී කුරුප්පු මහත්තයාව කොහොම හරි මුණගස්වා දෙන්න.." කියා ය. ඩී බී ගේ අගය නිසි ලෙස ගක්සේරු කළ බොහෝ අය සිටින බව ඒ සිදුවීම මට පසක් කළේ ය.

මංජුලත්, ඩීබී කුරුප්පු මහතාත්, දිනමිණේ සම්පත් බණ්ඩාරත්, ගජමනුත්, ශ්‍රීනාත් මද්දුමගේ සොයුරාගේ නිවසේ දී කළ සාහිත කතිකාව අමතක නොවන එකකි. සත්තකින්ම එදා රාත්‍රිය අතිශය සුන්දර එකකි.

පසුදා උදෑසන මංජුල හා සම්පත් බ්‍රෝඩ්මොඩෝස් දුම්රියපොලෙන් දුම්රියට නංවා ආපසු එන අතරේදී මා අතින් මෙසේ ලියවුණි.

සමුගැනීමෙන් පසු

පාලුය දුම්රිය වේදිකාව
නුඹ සමුගෙන ගිය පසුව
ඇසිපිය තුළම සැඟවුණ
කඳුලක උණුසුමද මේ..?

කටුක ලෙස ගත වෙළෙන
සීතලය මෙල්බන් සුළඟ
වෙනදා වාගේම...
නොහැකි වේ ම ය
නිවන්නට
සහෝදරත්වයේ උණුසුම
මට දැනුණ,
නුඹ අවසන් වරට
වැළඳගත් නිමේෂයේ

නුඹේ හදවත
හරිම උණුසුමයි
මගේ සිත තුළ

එනමුදු.....
නුඹේ හදනය
සීතලයි
වෙනදා වාගේ ම...